# ලංසු ආරාධනයයි

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
## නැගෙනහිර පළාත

01. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ශ්‍රේණි සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය **CIDA ලියාපදිංචිය** ඇති යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් පහත සඳහන් කාර්යයන් සඳහා මුද්‍රාතබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම්ලත් ලංසුකරුවන් **නැගෙනහිර කලාපය** තුළ විය යුතු අතර, **ඔවුන්ගේ ලියාපදිංචි ලිපිනයද නැගෙනහිර පළාත** විය යුතුය.

03. ලංසුපත් ලියකියවිලි **2016.07.26 දින ප.ව. 3.00** දක්වා පහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තු මුදල **මඩකලපුව, කල්ලඩි, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත** ගෙවීමෙන් පසු ලබාගත් ලදුපත **මඩකලපුව, කල්ලඩි, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වෙත** ඉදිරිපත් කිරීමෙන් පසු මිල දී ගත හැක.

04. ප්‍රසම්පාදන ක්‍රමය වනුයේ තනි පියවර තනි කවර විවෘත තරගකාරී ලංසුකරණයයි.

05. ලංසුකරුවන් හට ලංසුපත් ලියකියවිලි පිටපත් දෙකකින් යුතුව ලබා ගැනීමේ හැකියාව ඇත. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ලංසුපත් ලියකියවිලි ලබා ගැනීමට පෙර නොමිලේ එම ලේඛන පරීක්ෂා කිරීමට හැකි අතර, **වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් විධායක ඉංජිනේරු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කල්ලඩි, මඩකලපුව යන** ලිපිනයෙන් ලබා ගත හැක. **(දුරකථන අංක 065 - 2222910)**

06. සම්පූර්ණ කරන ලද ලංසුපත් ලියකියවිලි පහත වගුවේ සඳහන් මුදල් සඳහා ලංසු ඇපකරයක් සමග **සභාපති, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඇතුළු වරාය පාර, ත්‍රිකුණාමලය යන** ලිපිනයට **2016.07.27 දින ප.ව. 2.30** හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම මේ සඳහා පැමිණෙන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී ලංසුපත් **ත්‍රිකුණාමලය, ඇතුළු වරාය පාර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දී** විවෘත කිරීම සිදු කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පෙර ලංසු කැඳවීමේ රැස්වීමක් **මඩකලපුව, කල්ලඩි, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී 2016.07.20 වන දින පෙ.ව. 10.00 ට** පවත්වනු ලැබේ.

08. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුය.

**වගුව**

| කාර්යයේ නම | CIDA ශ්‍රේණිය | ඉදිකිරීම් පිරිවැය රුපියල් | කොන්ත්‍රාත් කාලසීමාව | ආපසු නොගෙවන ගාස්තු රුපියල් | ලංසු වලංගුතාවය | ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මුදල රුපියල් | වලංගු කාලසීමාව |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ කළුවාන්චිකුඩි මූලික රෝහලේ උපදේශක නිලනිවාසය ඉදි කිරීම | C7 | 9,668,825.06 | මාස 04 | 4,000.00 | දින 77යි | 97,000.00 | දින 105 යි |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තාන්කුඩි මූලික රෝහලේ උපදේශක නිලනිවාසය ඉදි කිරීම | C7 | 9,668,825.06 | මාස 04 | 4,000.00 | දින 77යි | 97,000.00 | දින 105 යි |

09. සාර්ථක ලංසුකරුවන් හට සපයා ඇති පිරිවිතර සමග නියමිත කාල රාමුවක් තුල අනුකූල මෙම සේවා සම්පූර්ණ කිරීම සඳහා ඔවුන් හට සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට පහත සඳහන් සුදුසුකම්ද සැපයිය යුතු වේ.

| අවශ්‍යතාව | විස්තරය |
|---|---|
| **සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම** | සාර්ථක ලංසුකරුවකු හට අවම වශයෙන් සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රුපි. මිලියන 10.00 තිබිය යුතු වේ. අවම වශයෙන් වසර 03 කට අදාල විගණන මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වේ |
| **ඒකාකාර කාර්යයන්** | සාර්ථක ලංසුකරුවකු පසුගිය වසර 03 තුළ රුපි. මිලියන 10.00 ට නොඅඩු වටිනාකමින් යුත් ඒකාකාර කාර්යයක් සම්පූර්ණ කර තිබිය යුතු වේ. (අවසන් වාර්තාව අමුණා තිබිය යුතු වේ) |
| **මූල්‍ය ධාරිතාවය** | සාර්ථක ලංසුකරුවකු හට රුපි. මිලියන 5.00ක බැංකු ණය පහසුකම් හෝ ද්‍රව මුදල් වටිනාකමක් තිබිය යුතු වේ. (එය ඔප්පු කිරීම සඳහා සාක්ෂි අමුණා තිබිය යුතු වේ) |

**ඉංජිනේරු. කේ. චන්ද්‍රමෝහන්**
**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**පළාත් අධ්‍යක්ෂක**
**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**
**නැගෙනහිර පළාත**
**ඇතුළු වරාය පාර**
**ත්‍රිකුණාමලය.**
**දුරකථන අංක 026 - 2222016**
**දිනය 2016.07.12**